**සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනය - 2022**
**----------------------------------------------------------------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරී මෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම් කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ ඇතුළත් මෙහෙයුම් අත්පොතෙහි 3.1 වගන්තිය | සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනයේ සේවක සංඛ්‍යාව, සේවක වැටුප් හා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට අදාළව භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2021.01.11 දින නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශයේ (පෙර අමාත්‍යාංශයේ) ලේකම් වෙත නිකුත් කරන ලද ලිපියට අනුව, NSBM ආයතනයට NSBM ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවසර දීමට විරුද්ධ නොවන බව පැහැදිළි කර ඇත. සංගමයේ වගන්ති යටතේ පවරා ඇති බලතල.<br>ලිපිවලට අනුව සමාගමේ ව්‍යාපාරික කටයුතු කළමනාකරණය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම හෝ අධීක්ෂණය යටතේ ය. | භාණ්ඩාගාර චක්‍රලේඛ අනුගමනය කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | සමාගම විසින් සකස් කරන ලද 2021 පෙබරවාරි 18 දිනැති සංශෝධිත මූල්‍ය හා ගිණුම්කරණ මෙහෙයුම් අත්පොතේ 6.4 වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 පොදු ව්‍යවසාය චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.7 වගන්තිය. | 2022 දෙසැම්බර් 31 දිනට රුපියල් 12,463,848,719 ක් වටිනා දේපළ, කම්හල් සහ උපකරණ සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයක් පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් සත්‍යාපනය 2022 වර්ෂයේදී ආරම්භ කර තිබුණද එම කාල සීමාව තුළ පැවති විවිධ ආර්ථික තත්ත්වයන් හේතුවෙන් එය ප්‍රමාද විය. කෙසේ වෙතත්, දැන් තහවුරු කිරීම අවසන් කර ඇත. | සමාගම විසින් යොමු කරන ලද රෙගුලාසියට අනුව වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයක් පැවැත්විය යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **190,744,927** අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. **677,822,872**ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **487,077,945** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ණය සඳහා පොලී ගෙවීම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 අනුපාත විශ්ලේෂණය**

පෙර වසරේ සියයට 14.4ක් වූ සමාගමේ ශුද්ධ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 4.7 දක්වා අඩු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 ජනවාරි මස සකස් කරන ලද මූල්‍ය සහ ගිණුම්කරණ මෙහෙයුම් අත්පොත සහ 2021 පෙබරවාරි 18 වැනි දින සංශෝධනය කරන ලද සහ සමාගමේ අභ්‍යන්තර මෙහෙයුම් පාලනය සඳහා භාවිත කෙරෙන මූල්‍ය සහ ගිණුම්කරණ මෙහෙයුම් අත්පොත සඳහා මව් සමාගමේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | NSBM සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ විධිමත් ලෙස සංස්ථාපිත සමාගමකි. NSBM හි සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සමාගමේ ව්‍යාපාර කටයුතු කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සියලු බලතල අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ..<br>සාංගමික ව්‍යවස්ථාවලියට අනුව NIBM (මව් සමාගම) හි සාමාජිකයින්ගෙන් ද මණ්ඩලය සමන්විත වන බව. | මව් සමාගමෙන් අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) විසින් 2017 වසරේ සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනයේ (NSBM) රු. 800,000,010ක් ආයෝජනය කර ඇති අතර, 2020 සිට 2022 මූල්‍ය වර්ෂය දක්වා ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයට කිසිදු ප්‍රතිලාභයක් ලබා දී නොතිබුණි. එමෙන්ම ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 02 වැනි දින පාර්ලිමේන්තුවේ පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ පිළිබඳව සාකච්ඡා කළ අතර, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළැඹීමට සහ මෙම ආයතන දෙකෙහි අධීක්ෂණය සහ ව්‍යුහය නිරීක්ෂණය කිරීම සඳහා විශේෂඥ මණ්ඩලයක් පත් කරන ලෙස එම කමිටුව විසින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරියාට නියෝගයක් නිකුත් කරන ලදී. | ඒ අනුව, 2020 සිට 2022 දක්වා අදාළ වර්ෂ සඳහා සිදු කරන ලද නුබුන්වත්භාවය පිළිබඳ සදු කරන ලද පරීක්ෂාවේදී ලාභාංශ බෙදාහැරීම වෙනුවෙන් සෑහීමකට පත්වී නැත. මෙම තත්ත්වය වාර්ෂික මහා සභා රැස්වීමේදී සාකච්ඡා කර ඇති අතර ලාභාංශ ප්‍රකාශ නොකිරීමේ තීරණයට NIBM හි සභාපතිවරයා සහ නියෝජිතයින් සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව එකඟ වූ බව. | ආයෝජනය කරන මුදලට සාධාරණ ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශය අනුව ආයතන දෙකෙහි පැවැත්ම සහ ව්‍යුහය අධීක්ෂණය කිරීම සඳහා විශේෂඥ මණ්ඩලයක් පත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා කටයුතු කළ යුතුය. |